ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,882 — 1931ක්වූ සැප්තැම්බර් මස 18 වෙනි දිනවූ සිකුරාදා.

# Part IV.— හතරවෙනි කාණ්ඩය.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—හාලිඇලේ ප්‍රසිද්ධ වැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 97 අන්තිම ගම් සිතියමේ නො. 5 අතිරේකය. ගම—බෝගොඩකෝරලේ මැදපිටගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 18G | ගන්හිලේ | මුඩුබිම | හාලිඇලේ සයනේරිස් අප්පුහාමි | 0 0 11 |
| 18H | එම | එම | එම | 0 0 0·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින අපරභාග 2යේ කාහිසමට බදුළු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින
බදුළු කච්චේරියේදීය.

ඒ. ඊ. මිලින්වන්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, 'ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ප්‍රසිද්ධ වැසිකිලියක් සහ එහි යාමට පාරක්ද සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 3,038. ගම—රත්නපුර නගරසීමාතුළ.

| නො. | ඉඩමේ නම. | අතුම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙත්තරපිටියේවත්ත | පොල්වත්ත | ඒ. ඇල්. ඇම්. මුස්තාපා හජ්ජියාර්ගේ බූදලේ උරුමක්කාරයෝ | 0 0 9·2 |
| 2 | එම | එම | එම | 0 0 8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින උදේ 10.30යේ කාහිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 9වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

449——J. N. 12606–121 (9/31)

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ඉද්දමල්ගොඩ පාඨශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රි සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 4,165. ගම—ඉද්දමල්ගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කොස්ගොලවත්ත .. | වත්ත .. | කේ. පී. ඒ. ජෝන්සිඤ්ඤෝ සහ තවත් අය .. | 0 0 33·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇතතාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන්වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින උදේ 10.30යේ කාසිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 14වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

සී. එච්. කොලින්ස්,
සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## ටෙණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### තොටුපල් රේන්ද විකිණීම.

වර්ෂ 1932ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසානවන අවුරුද්දට මෙහි පහත සඳහන් වෙන කළුතර දිස්ත්‍රික්කේ තොටුපල් රේන්ද මිලේට ගැණීම පිණිස දෙන වැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 30වෙනි බදාදා දවල් 12ට කළුතර කච්චේරියේදී කළුතර දිස්ත්‍රික්කේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගනු ලැබේ.

2. මෙහි පසට සඳහන්වෙන එක එක රේන්දයට වෙන වෙනම වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

3. භාරගන්නලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්නට ඕනෑය. එම ඉල්ලීම කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගන්නට යෙදුනිනම්, ඔහුගේ ඉල්ලීම ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුළතදී ඉල්ලූ ගණනෙන් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණ කරන්ට ඕනෑය.

4. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා කොමිටියේ පෙරකදෝරුතැනට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රිජිස්තර්කිරීමටද, වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත (අළුත්වැඩියාකරණලද 1917 නො. 16 පණත) අනුමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

5. ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්ව නැති බවට ඉඩම් ලියා පදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැණීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුය.

යම් ටැන්ඩරයක් හෝ ටැන්ඩර් සියල්ලම ප්‍රශ්නයක් නැතිව ප්‍රතික්ෂෙපකිරීමේ බලය කොමිටියේ ප්‍රධානතැනවෙත තබාගන්ට යෙදුනා ඇත.

මේ ගැන වැඩිදුර කාරණා දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධාන තැනගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

1. රැක්ගහතොටුපල තොටුපල් රේන්දය.

ඇල්. ඇල්. හන්ටර්,
ප්‍රධානතැන.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 14වෙනි දින කළුතර
දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවේදීය.

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය සරණකොටගෙන මෙයින් ප්‍රකාශකරන්නේනම් බස්නාහිර දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙන මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

කාල් ඒ. ආන්විස්,
බ. දි. දෙ. පිස්කල් වම්හ.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 10වෙනි දින
කොළඹ පිස්කල් කන්තෝරුවේදීය.

---

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය සරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් රත්නපුර දිසාවේ ක්‍රිමිනල් නඩු විභාගය වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින පෙරවරු 11 පැය පටන් කොළඹ අළුත්කඩේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැම දෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

සී. එච්. කොලින්ස්,
ස. දි. පිස්කල් වම්හ.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 12වෙනි දින
රත්නපුරේ පිස්කල් කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීම.

කොළඹ දිස්ත්‍රික්කුවේ සියනෑකෝරළේ ගඟබඩපත්තුවේ රඳවානේ පදිංචි උඩගම විජයතුඞ්ගආරච්චිගේ පේද්‍රික් පියරත්න වන මම කොළඹ දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගියතැනදී රෙජිස්ත්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලුම්කරනබව වර්ෂ 1907 අංක 1 දරණ ආඥාපනතේ 1 B දරන උප ලෙඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

යූ. ඩබ්ලිව්. පී. පියරත්න.

1931 සැප්තැම්බර් 2.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.